Check
7/4/74

ශ.

# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 86 — 1973 නොවැම්බර් 16 වැනි සිකුරාදා — 1973.11.16

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිට |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය ... | 1165 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත් කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත් කිරීම් ආදිය... | 1167 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 1170 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1171 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1177 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |



## ජනාධිපතිතුමාණන් විසින් කරන පත්කිරීම් ආදිය

### 1973 අංක 527

අංකය : සී. 21/ආර්පීසීටී/725

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරියා 1973 නොවැම්බර් මස 05 වැනි දින සිට යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :—

ලුතිනන් කර්නල් රොනල්ඩ් හෙක්ටර් පෙරේරා, ලඅ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් මස 06 දින,
කොළඹ දී ය.

11-783—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

### 1973 අංක 528

අංකය : සී. 250/ආර්පීසීපී/3 (III)

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දිනවල සිට මේජර්වරුන් වශයෙන් :—

කපිතාන් (තාවකාලික මේජර්) එස්. ආනන්ද සුන්දරම්, ගැහේබ.—1971 ජූනි 01

කපිතාන් (තාවකාලික මේජර්) ඩබ්ලිව්. කේ. නානායක්කාර, ලපාහ.—1970 නොවැම්බර් 17

කපිතාන් (තාවකාලික මේජර්) ඩබ්ලිව්. ඒ. සී. ප්‍රනාන්දු, ලයුසේබ.—1971 ජූනි 01

කපිතාන් (තාවකාලික මේජර්) සී. විජයසිංහ, ලසිරෙ.—1972 ජූනි 01

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරයෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

කපිතන් (තාවකාලික මේජර්) ටී. එම්. රජුඩීන්, ලපාහ.—1971 ජූනි 18
කපිතන් (තාවකාලික මේජර්) ඩී. එස්. ඩබ්ලිව්. කුරුප්පු, ලසබ.—1971 ඔක්තෝබර් 01
කපිතන් (තාවකාලික මේජර්) ඩබ්ලිව්. එම්. වීරසූරිය, ලඉ.—1972 ජනවාරි 24
කපිතන් (තාවකාලික මේජර්) ජේ. ආර්. එස්. ද සිල්වා, ලඉ.—1972 ජනවාරි 24
කපිතන් (තාවකාලික මේජර්) කේ. එස්. එස්. සිල්වා, ලයුපොදු සේබ.—1972 පෙබරවාරි 17
කපිතන් (තාවකාලික මේජර්) පී. පක්ෂවීර, ගැසේබ.—1972 ජූනි 01
කපිතන් (තාවකාලික මේජර්) කේ. එල්. ද එස්. ජයවර්ධන, ලකාහ—1972 ජූනි 17
කපිතන් (තාවකාලික මේජර්) ටී. ආර්. වී. ජයතුංග, ලසිරෙ.—1972 ජූනි 17
කපිතන් (තාවකාලික මේජර්) එෆ්. එක්ස්. ඒ. ආර්. ප්‍රනාන්දු, ලකාහ—1972 ජූනි 17
කපිතන් (තාවකාලික මේජර්) එච්. සී. ශවාහිර්, ලපාහ.—1973 ජනවාරි 22
කපිතන් (තාවකාලික මේජර්) ඒ. රත්නායක, ලකාහ.—1973 ජනවාරි 22
කපිතන් (තාවකාලික මේජර්) එච්. එම්. විජේරත්න බණ්ඩා, ලපාහ—1973 මාර්තු 23
කපිතන් (තාවකාලික මේජර්) පී. එන්. බී. සී. විජේසේන, ලයුයුබ.—1973 අප්‍රේල් 01
කපිතන් (තාවකාලික මේජර්) සී. එල්. කත්‍රිආරච්චි, ලයුපොදුසේබ.—1973 අප්‍රේල් 01
කපිතන් (තාවකාලික මේජර්) එන්. පී. නාගසිංහ, ලඉ.—1973 ජූනි 13
කපිතන් (තාවකාලික මේජර්) එල්. ටී. ප්‍රනාන්දු, ගැසේබ.—1973 ජූනි 15
කපිතන් (තාවකාලික මේජර්) එස්. පී. ද සිල්වා, උපාහ.—1973 ජූනි 15.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 27 දින,
කොළඹදීය.

11-523—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 529**

අංකය : ඞී. 250/ආර්ජීසිවී/3 (IV).

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

පහත නම සඳහන් නිලධාරියා 1973 ජූනි මස 01 වැනි දින සිට මේජර් වශයෙන් :—

කපිතන් එස්. එල්. මාන්වඩු, ලයුවෙබ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 27 දින,
කොළඹ දී ය.

11-518/1—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 530**

අංකය : ඞී. 250/ආර්ජීසිවී/3 (IV).

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

පහත නම සඳහන් නිලධාරියා 1973 ජූනි මස 01 වැනි දින සිට මේජර් (උපකරණ පාලක) වශයෙන් :—

කපිතන් (උපකරණ පාලක) ටී. වී. මාටින්ස්ටයින්, ලසසබ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 27 දින,
කොළඹ දී ය.

11-518/5—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

**1973 අංක 531**

අංකය : ඞී. 250/ආර්ජීසිවී/3 (IV).

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

පහත නම සඳහන් නිලධාරියා 1972 ජනවාරි මස 01 වැනි දින සිට තාවකාලික මේජර් වශයෙන් :—

කපිතන් ඩී. සී. ආර්. ද සිල්වා, ලසිරෙ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 27 දින,
කොළඹ දී ය.

11-518/6—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 532**

අංකය : ඞී. 250/ආර්ජීසිවී/3 (IV).

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

පහත නම සඳහන් නිලධාරියා 1973 ජූනි මස 01 වැනි දින සිට තාවකාලික මේජර් වශයෙන් :—

කපිතන් සී. ජේ. අබයරත්න, ලසබ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 27 දින,
කොළඹ දී ය.

11-518/4—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 533**

අංකය : ඞී. 250/ආර්ජීසිවී/3 (IV).

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

පහත නම සඳහන් නිලධාරියා 1973 ජූනි මස 01 වැනි දින සිට තාවකාලික මේජර් වශයෙන් :—

කපිතන් බී. මුණසිංහ, ලවියාඉ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 27 දින,
කොළඹ දී ය.

11-518/2—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 534**

අංකය : ඞී. 250/ආර්ජීසිවී/3 (IV).

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

පහත නම සඳහන් නිලධාරියා 1973 ජූනි මස 01 වැනි දින සිට තාවකාලික මේජර් වශයෙන් :—

කපිතන් ඒ. ආර්. පී. විජේරත්න, ලසිරෙ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 27 දින,
කොළඹ දී ය.

11-518/3—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

1973 අංක 535

අංකය : ඩී/වීඑප්/30 (II)

**යුද්ධ හමුදුව—ශ්‍රී.ලං.සෙව.බ.—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පදවිය අත්හැරීමක්, විශ්‍රාම ගැන්වීමක් සහ පත් කිරීමක්**

**(අ) පදවිය අත්හැරීම.**

කර්නල් සිසිල් මාසල් පෙරේරා, 1973 ඔක්තෝබර් මස 01 වැනි දින සිට 4 වන සංවර්ධන හා නිර්මාන රෙජිමේන්තුව, ලංකා ඉංජිනේරු (ස්වේච්ඡා) හි අණදෙන නිලධාරී පදවිය අත්හරින ලදී.

**(ආ) විශ්‍රාම ගැනීම.**

1973 ඔක්තෝබර් මස 01 වැනි දින සිට කර්නල් සිසිල් මාසල් පෙරේරා, ශ්‍රී ලංකා සෙවච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගනු ඇත.

**(ඇ) පත් කිරීම.**

1973 ඔක්තෝබර් මස 01 වැනි දින සිට 4 වන සංවර්ධන හා නිර්මාන රෙජිමේන්තුව, ලංකා ඉංජිනේරු (සෙවච්ඡා) හි අණදෙන නිලධාරී වශයෙන් ලුතිනන්—කර්නල් පොන්නහැන්නදිගේ නාගේෂා කමල් ඔයස්, ලංඉ., පත් කර ඇත.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්‍ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් 27 දින,
කොළඹ දී ය.

11–574—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 536

අංකය : ඩී/වීඑප්/42 (III).

**යුද්ධ හමුදාව—ශ්‍රී ලංකා ස්වේච්ඡා බල සේනාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා ස්වේච්ඡා බල සේනාවේ පොදු උප සේවයට මාරු කිරීමක්**

1973 ඔක්තෝබර් මස 01 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියාව ශ්‍රී ලංකා ස්වේච්ඡා බල සේනාවේ පොදු උප සේවයට මාරු කරන ලදී.

මේජර් චින්තසියා රාජතුරෙයි., ලංජාආමු.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 30 දින,
කොළඹ දී ය.

11–520—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 537

අංකය : ඩී/වීඑප්/2/ඒ (III).

**යුද්ධ හමුදව—ශ්‍රී ලංකා ස්වේච්ඡා බල සේනාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්**

1973 සැප්තැම්බර් මස 14 වැනි දින සිට යුද්ධ හමුදවේ ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවේ පහත නම සඳහන් නිලධාරියාගේ ඉල්ලා අස්වීම ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලදී.

දෙවන—ලුතිනන් ශ්‍රේබ්‍රියල් මෝහන් ශරාක්වුඩ්, ලපාහ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් 27 දින,
කොළඹ දී ය.

11–779—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 538

අංකය : ඩී. 251/ආර්ජිසීවී/3 (IV)

**ශ්‍රී ලංකා නාවික හමුදව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1973 සැප්තැම්බර් මස 1 වැනි දින සිට

ලුතිනන් කොමාන්ඩර් (ඉ) පදවියට :—

ලුතිනන් (ඉ) එච්. එල්. එල්. එම්. කරුණාරත්න, ශ්‍රීලංනාහ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් මස 06 දින,
කොළඹ දී ය.

11–782—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 539

අංකය : ඩී/වීඑප්/18/ඒ (IV)

**ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික බලකාය—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක් හා සහ පත් කිරීමක්**

1974 ජනවාරි මස 01 වැනි දින සිට කපිතාන් පදවියට :

කොමාන්ඩර් ජේ. එම්. ද කොස්තා, ශ්‍රීලං.ස්වේ.නා.හ.

1974 ජනවාරි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික බලකායේ සහ ශ්‍රීලං.නා.නෞ. "ලංකා" හි අණදෙන නිලධාරී වශයෙන් :

කපිතාන් ජේ. එම්. ද කොස්තා, ශ්‍රීලං.ස්වේ.නා.හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් 27 දින,
කොළඹදීය.

11–519—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 540

අංකය : ඩී./වීඑප්/75.

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීම**

1973 නොවැම්බර් 01 දින සිට ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවෙන් පහත නම සඳහන් නිලධාරියාගේ ඉල්ලා අස්වීම, ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගෙන ඇත.

ෆ්ලයිට් ලේෆ්ටිනන්ට් කරුණාරත්න තිසේරා සන්දනායක (වී/0060)—වෛද්‍ය.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 30 දින,
කොළඹ දී ය.

11–521—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

# අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය

1973 අංක 541

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 (5) වැනි වගන්තිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් අධිකරණ සේවා උපදේශක මණ්ඩලය ලේකම් වෙත පවරන ලද බලතල යටතේ පහත සඳහන් වැඩ බැලීමේ පත් කිරීම් කර ඇත**

පී. එඩිස් සූරිය මහතා 1973 නොවැම්බර් මස 01 දින සිට නැවත නියෝගයක් කරන තෙක් අධිසංඛ්‍යා නිලධාරියෙකු වශයෙන් සහ කොළඹ බම්බලපිටියේ විශේෂ උසාවියේ ක්‍රියා කරන කොළඹ ළමා මහෙස්ත්‍රාත් වශයෙන් සහ කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට,

30. සී. ජී. එල්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ක්‍රිස්ටි විජේරත්න මහතා 1973 ඔක්තෝබර් මස 22, 23, 24 සහ 26 දිනයන්හි හේවාගම කෝරලේ නැගෙනහිර හේවාගම කෝරලේ බටහිර සල්පිටි කෝරලේ සහ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

31. කේ. ජේ. ජස්ටින් පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජී. කරුණාරත්න මහතා 1973 ඔක්තෝබර් මස 16 වැනි දින අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරලේ පහල බුලත්ගම, අටළුගම සහ පනාවල් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ බෙලිගල් කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

32. ඩී. බී. ඇල්ලෙපොල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එච්. ධර්මදාස මහතා 1973 නොවැම්බර් මස 01 වැනි දින කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ කිනිගොඩ, බෙලිගල් සහ පරනකූරු කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

33. ඩී. බී. ඇල්ලෙපොල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ප්‍රේමචන්ද්‍ර රණතුංග මහතා 1973 නොවැම්බර් මස 02 වැනි දින කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ කිනිගොඩ, බෙලිගල් සහ පරනකූරු කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

34. ඩී. බී. ඇල්ලෙපොල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, නිශ්ශංක උදලාගම මහතා 1973 සැප්තැම්බර් මස 20 දින සහ ඔක්තෝබර් මස 29 සිට 31 දින දක්වා කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ කිනිගොඩ, බෙලිගල් සහ පරනකූරු කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයන් වැඩ බැලීමට.

35. කේ. කණපතිපිල්ලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, කේ. පී. සිතාරාමන් මහතා 1973 ඔක්තෝබර් මස 26 වැනි දින ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර් පත්තු ගම්බද උසාවි සභාපති සහ කඩ්ඩුකුලම් සහ තම්පලාකාමම් පත්තු අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

36. ජී. එච්. ජී. එල්. ඒ. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නිමයයක් කරනතුරු, එච්. බී. රත්නායක මහතා 1973 ඔක්තෝබර් මස 12 වැනි දින බදුල්ල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස බින්තැන්න සහ බුත්තල ගම්බද උසාවි සභාපති සහ යටිකිඳ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

37. ජී. එස්. වත්තෙගෙදර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. එස්. ඉහළගම මහතා 1973 ඔක්තෝබර් මස 13 සහ 15 දිනයන්හි කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඩවිලි හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

38. ආර්. ඩබ්ලිව්. ජී. වීරසූරිය මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ටී. යූ. කරවිට මහතා 1973 සැප්තැම්බර් මස 17 සහ 18 දිනයන්හි අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පළාත් දකුණ, උතුර, බස්නාහිර සහ නැගෙනහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

39. ඩබ්ලිව්. බී. දසනායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සුනිල් ජේ. අතපත්තු මහතා 1973 නොවැම්බර් මස 07 වැනි දින ගම්පහ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරලේ බස්නාහිර සියනෑ කෝරලේ (මැදපත්තු) සහ හාපිටිගම් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ දකුණු අළුත්කුරු කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

40. එච්. එම්. එස්. බී. මඩවල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. ඒ. යටවර මහතා 1973 ඔක්තෝබර් මස 10 සහ 12 වැනි දිනයන්හි මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුර ගම්බද උසාවි සභාපති සහ නැගෙනහිර අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

41. එච්. එම්. එස්. බී. මඩවල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. ඒ. එල්. අබේසේකර මහතා 1973 සැප්තැම්බර් මස 19 වැනි දින මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුර ගම්බද උසාවි සභාපති සහ මාතලේ නැගෙනහිර අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

42. කේ. නාගලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. අම්ර්තලිංගම් මහතා 1973 සැප්තැම්බර් මස 27 සිට 29 දක්වා යාපනය සහ පේදුරුතුඩුව දිස්ත්‍රික්කයන්හි උතුරු වලිකාමම්, නැගෙනහිර වලිකාමම් වඩමරච්චි හා යාපනය ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

43. කේ. නාගලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, කේ. විග්නේශ්වරන් මහතා 1973 ඔක්තෝබර් මස 17 වැනි දින යාපනය සහ පේදුරුතුඩුව දිස්ත්‍රික්කයන්හි උතුරු වලිකාමම්, නැගෙනහිර වලිකාමම්, වඩමරච්චි සහ යාපනය ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

44. ටී. පී. පස්සල මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1973 නොවැම්බර් මස 1 වැනි ද සිට තවදුරටත් දින පහළොවක කාල පරිච්ඡේදයක් සඳහා බදුල්ලේ පරිපාලන දිස්ත්‍රික්කයේ වැඩ බලන කාතිවරයා වශයෙන්.

ලයනල් සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම්.

අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩල කාර්යාලය,
තැ.පෙ. අංක 573,
1973 නොවැම්බර් මස 7 වැනි දින,
සී. 52, කැප්පෙටිපොල පාර,
කොළඹ 5 දී ය.

11–771/1—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

### අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම් විසින් කරන ලද අවලංගු කිරීම්

1. එස්. ඒ. යටවර මහතා 1973 සැප්තැම්බර් මස 19 වැනි දින එච්. එම්. එස්. බී. මඩවල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුර ගම්බද උසාවි සභාපති වශයෙන් සහ මාතලේ නැගෙනහිර අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට කරන ලද පත්වීම මෙයින් අවලංගු කරමි.

2. පී. රණතුංග මහතා 1973 සැප්තැම්බර් මස 20 වැනි දින ඩී. බී. ඇල්ලෙපොල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ, කිණිගොඩ, බෙලිගල් සහ පරණකූරු කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට කරන ලද පත්වීම මෙයින් අවලංගු කරමි.

3. එස්. අම්ර්තලිංගම් මහතා 1973 සැප්තැම්බර් මස 27 සිට 29 දක්වා කේ. නාගලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, කල්මුනේ දිස්ත්‍රික්කයේ කරවකු සහ නින්තාවූර්පත්තු සහ වැවගම්පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් කරන ලද පත්වීම මෙයින් අවලංගු කරමි.

ලයනල් සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම්.

අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩල කාර්යාලය,
තැ.පෙ. අංක 573,
1973 නොවැම්බර් මස 7 වැනි දින,
සී. 52, කැප්පෙටිපොල පාර,
කොළඹ 5 දී ය.

11–771/2—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

## වෙනත් පත් කිරීම් ආදිය

### 1973 අංක 543

අංකය : ඊ/පී 14/1/46 (11)

ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යතුමිය විසින් පොලිස් අධිකාරි එස්. එස්. ජෝශප් මහතා, 1972 ජූලි මස 15 වැනි දින සිට නියෝජ්‍ය පොලිස් පතිවරයෙකු ලෙස පත් කර තිබේ.

වී. ටී. ජයසිංහ,
ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් මස 5 දින,
කොළඹ දී ය.

11–719—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

### 1973 අංක 544

අංකය : ඩී. 251/ආර්ඊසීපී/1.

**ශ්‍රී ලංකා නාවික හමුදාව—නිලධාරීන් ස්ථිර කිරීම**

1973 මැයි මස 01 දින සිට උප ලුතිනන් වශයෙන් :—

වැඩබලන උප ලුතිනන් කේ. ඒ. ශ්‍රී නාග, ශ්‍රීලංනාහ.

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් 27 දින,
කොළඹදීය.

11–522—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

### 1973 අංක 545

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පහත සඳහන් පත්වීම් කර ඇති බව මෙයින් දන්වනු ලැබේ :—

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, එස්. නුලංගමුව මහතා 1973.07.09 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, දනට දරණ මහනුවර පාලන දිස්ත්‍රික්කයේ මූලස්ථාන ප්‍රාදේශීය ආදායම් නිලධාරි තනතුරේ ස්වකීය රාජකාරිවලට අතිරේකව මහනුවර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. බී. සිරිසේන මහතා 1972.10.19 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, දනට දරණ අනුරාධපුර පාලන දිස්ත්‍රික්කයේ මූලස්ථාන ප්‍රාදේශීය ආදායම් නිලධාරි තනතුරේ ස්වකීය රාජකාරිවලට අතිරේකව අනුරාධපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. ඒ. එස්. ගුණසේකර මහතා 1973.01.30 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, දනට දරන අනුරාධපුර පාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ඉඩම් නිලධාරී සහ පදවිය කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තනතුරේ ස්වකීය රාජකාරිවලට අතිරේකව, අනුරාධපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඒ. විජේතුංග මහතා 1973.03.03 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, දනට දරන හම්බන්තොට පාලන දිස්ත්‍රික්කයේ උතුරු ගිරුවා පත්තුව කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තනතුරේ ස්වකීය රාජකාරිවලට අතිරේකව, හම්බන්තොට පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එස්. පත්තුනම් මහතා 1973.03.07 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, දනට දරන ත්‍රිකුණාමලය පාලන දිස්ත්‍රික්කයේ තම්පලාකාමම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තනතුරේ ස්වකීය රාජකාරිවලට අතිරේකව, ත්‍රිකුණාමලය පාලන දිස්ත්‍රික්කයේ ත්ත්නියා කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන් වැඩ බැලීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එස්. අල්ගම මහතා 1973.03.10 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, දනට දරණ කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ මහව කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තනතුරේ ස්වකීය රාජකාරිවලට අතිරේකව, කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එස්. සොර්ණවඩිවේල් මහතා 1973.05.02 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, දනට දරන මඩකලපුව පාලන දිස්ත්‍රික්කයේ එරාවුර් පත්තු කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තනතුරේ ස්වකීය රාජකාරිවලට අතිරේකව, මඩකලපු පාලන දිස්ත්‍රික්කයේ කෝරළේ පත්තු කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තනතුරේ වැඩ බැලීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, වී. එස්. එස්. ඔගස්ටින් මහතා 1973.05.10 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, දනට දරන මන්නාරම පාලන දිස්ත්‍රික්කයේ මූලස්ථාන ප්‍රාදේශීය ආදායම් නිලධාරි තනතුරේ ස්වකීය රාජකාරිවලට අතිරේකව, මන්නාරම පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩබ්ලිව්. ඒ. ඩබ්ලිව්. පෙරේරා මහතා 1973.05.11 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, දනට දරන ගාල්ල පාලන දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුව දකුණ කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තනතුරේ සවකීය රාජකාරිවලට අතිරේකව ගාල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ දධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩබ්ලිව්. වී. සමරපාල මහතා 1973.05.11 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, දනට දරන ගාල්ල පාලන දිස්ත්‍රික්කයේ තල්පෙ පත්තුව (උතුර) කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තනතුරේ ස්වකීය රාජකාරිවලට අතිරේකව ගාල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ඩබ්ලිව්. එස්. හුළුගල්ලේ මහතා 1973.06.30 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, දනට දරන කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ වාරියපොල කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තනතුරේ ස්වකීය රාජකාරිවලට අතිරේකව, කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එස්. කලන්සූරිය මහතා 1973.07.02 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, දනට දරන කොළඹ පාලන දිස්ත්‍රික්කයේ දිවුලපිටිය කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තනතුරේ ස්වකීය රාජකාරිවලට අතිරේකව, කොළඹ පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

පී. එච්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973.11.03 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1–658—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

## ආණ්ඩුවේ නිවේදන

### 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනත

### 4 (1) වගන්තිය යටතේ නියමය

1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනතෙහි 4 (1) වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, නැව් කටයුතු හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යවර, පුංචි බණ්ඩා ගුණතිලක කළුගල්ල වන මම කෘෂිකර්ම හා ඉඩම් ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව, 1966 අංක 10 දරණ පනතින් පිහිටුවන ලද රජයේ සංස්ථාවක් වන, ලංකා සංචාරක මණ්ඩලයේ සංචාරික සංවර්ධන යෝජනා ක්‍රමයක කාර්යයන් උදෙසා මතු සඳහන් උපලේඛනයෙහි නිශ්චිත ලෙස දක්වෙන ඉඩම, එකී මණ්ඩලය වෙත මෙ මගින් පවරමි.

පී. බී. ජී. කළුගල්ල,
නැව් කටයුතු හා සංචාරක කටයුතු
පිලිබඳ ඇමති.

1973 නොවැම්බර් මස 05 දින,
කොළඹ.

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම්පත්තුව ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයෙහි, පලාතුපාන ග්‍රාමයෙහි පිහිටි,

උතුරින් : අ.භූ.පි. 5'හි කැබලි අංක 45, 46, 49 සහ 50 සහ අ.භූ.පි. 2'හි කැබලි අංක 283
නැගෙනහිරින් : අ.භූ.පි. 2'හි කැබලි අංක 287
දකුණින් : අ.භූ.පි. 2'හි කැබලි අංක 290 සහ 293
බටහිරින් : අ.භූ.පි. 5'හි කැබලි අංක 57 සහ අ.භූ.පි. 2'හි කැබලි අංක 294 යන මායිම්වලින් සීමාවූ, ප්‍රමාණයෙන් අක්කර එක් දහස් හැත්තෑවයි, රූඩ තුනයි, පර්චස් විසිනවයකින් (අක්. 1,070 රූඩ 3 පර්. 29) කින් සමන්විත වූද,

සර්වේයර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද, අ.භූ.පි, අංක 2 සහ 5'හි කැබලි අංක 53,289 සහ 286 ලෙස දක්වෙන ගෙරිමස් පොකුණ කැලේ දියබුන්වලකැලේ දෙවට කැලේ, මූකල ලේඩාය කැලේ. පලාතුපාන කැලේ යැයි හැඳින්වෙන බෙද වෙන්කල සියළු භූමි භාගය.

1 1–770—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

## කානායම් පනත

අංක 73 සහ 1973 අගෝස්තු 17, අංක 64 සහ 1973 ජූනි 14 දින හා අංක 42 සහ 1973 ජනවාරි මස 12 වැනි දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරවනලද දැන්වීම්වලින් සංශෝධිත අංක 37 සහ 1972 දෙසැම්බර් 8 දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති කානායම් රීති පහත සඳහන් පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(අ) උප ලේඛනයේ ලාංකික ආහාර—උදේ ආහාරය, දිවා භෝජනය හෝ රාත්‍රි භෝජනය යටතේ සඳහන්ව ඇති වචන සහ ඉලක්කම් ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙක්;

| ලාංකික ආහාර | අයකිරීම රු. ශ. |
|---|---|
| **උදේ ආහාරය** | |
| ආප්ප හෝ ඉදියප්ප<br>මස් හෝ මාළු ව්‍යංජනය<br>සම්බෝලයක්<br>තේ | 2 50 |
| බිත්තර ආප්ප (එකක්) ... | 0 50 |
| **දිවා හෝ රාත්‍රිභෝජනය** | |
| බත් සහ ව්‍යාංජන<br>මස් හෝ මාළු ව්‍යාංජනය<br>එළවළු වර්ග 3යි.<br>මැල්ලුමක්<br>සම්බෝලයක්<br>කරවල හෝ පපඩම්<br>පළතුරක් | 4 0 |
| ඉහත දක්වන ලද ආකාරයට එළවළු කෑම (මස් හෝ මාළු නොමැතිව) — | 3 0 |
| අමුත්තන් කැටුව එන රියැදුරන්ට — මෙහෙකරුවන්ට ආහාර — | 2 0 |

(ආ) උප ලේඛනයේ ලාංකික ආහාර සහ අපරදිග ආහාර යටතේ සඳහන්ව ඇති;

"එක් අයෙකු සඳහා තේ පෝච්චියක් ... සත 50
එක් අයෙකු සඳහා කෝපි පෝච්චියක් ... සත 75"

යන වචන හා ඉලක්කම් වෙනුවට පහත සඳහන් වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

"එක් අයෙකු සඳහා තේ පෝච්චියක් ... සත 75
එක් අයෙකු සඳහා කෝපි පෝච්චියක් ... රු. 1 0"

ඉහත සඳහන් සංශෝධනයන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් අනුමත කරනු ලැබ ඇති අතර, 1973 දෙසැම්බර් මස 1 වන ද සිට ක්‍රියාත්මක වනු ඇත.

පී. එච්. සිරිවර්ධන,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

1973 නොවැම්බර් මස 8 දින,
කොළඹ දීය.

11–760—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

එල් ඩී.—බී. 3/73

## ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව

119 (1) වගන්තිය යටතේ බලතල පැවරීම—සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (1) වගන්තිය යටතේ පවරා දෙනු ලැබූ බලතල.

ඩබ්ලිව්. පී. ජී. ආරියදාස,
සෞඛ්‍ය අමාත්‍ය.

1973 ඔක්තෝබර් 10 දින,
කොළඹදී.

### අංක. 1 දරණ බලතල පැවරීම

මෙයට යාකොට ඇති උපලේඛනයේ I වැනි තීරුවෙහි දක්වා ඇති බලතල එම උපලේඛනයේම II වැනි තීරුවෙහි අනුරූප සටහනෙහි දක්වා ඇති රාජ්‍ය නිලධාරියා හෝ රාජ්‍ය නිලධාරීන් හෝ වෙත, පහත සඳහන් කොන්දේසිවලට යටත්ව, මෙයින් පවරා දෙනු ලැබේ:—

(අ) අමාත්‍ය මණ්ඩලය විසින් හෝ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් හෝ කලින් කල නිකුත් කරනු ලැබිය හැකි විනය රීති වලට සහ වෙනත් එවැනි උපදෙස් වලට යටත්ව මෙම බලතල පාවිච්චි කළයුතු වන්නේ ය.

(ආ) මෙම බලතල පැවරීම යටතේ එවැනි නිලධාරියෙකු වෙත පවරනු ලැබූ යම්කිසි බලයක් යටතේ එම නිලධාරියා විසින් එළඹි තීරණයකින් සෑහීමකට පත් නොවන යම් තැනැත්තෙකුවේ නම් ඔහුට—

(i) එම තීරණය කරන ලද්දේ යම්කිසි නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයෙකු හෝ ප්‍රධාන ගණකාධිකාරී හෝ විසින් නම්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත අභියාචනය කළ හැකිය;

(ii) එම තීරණය කරන ලද්දේ ජ්‍යෙෂ්ඨ පාලන ශ්‍රේණියේ හෝ නියෝජ්‍ය පාලන ශ්‍රේණියේ හෝ යම්කිසි වෛද්‍ය නිලධාරියෙකු, රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරී, විදුලි වෛද්‍ය ඉංජිනේරුවරයා, වෛද්‍ය පරේයේෂණ ආයතනය භාර අධ්‍යක්ෂ හෝ වෛද්‍ය නිලධාරියා, ලාදුරු මර්ධන ව්‍යාපාරය භාර අධිකාරී හෝ වෛද්‍ය නිලධාරියා, කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරියා, කොළඹ අධිකරණ වෛද්‍ය කොට්ඨාශය භාර වෛද්‍ය නිලධාරියා, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රධාන ලිපිකරු හෝ ජ්‍යෙෂ්ඨ මුදල් ලිපිකරු හෝ විසින් නම් (පාලන) නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත අභියාචනය කළ හැකි වේ;

(iii) එම තීරණය කරන ලද්දේ නියෝජ්‍ය පරිපාලන ශ්‍රේණියේ යම්කිසි වෛද්‍ය නිලධාරියෙකු, යම්කිසි සෞඛ්‍ය සේවා අධිකාරී වරයෙකුගේ ලේකම්/ගණකාධිකාරී, කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරීගේ ලේකම්, මානසික සෞඛ්‍ය සේවා අධිකාරීගේ ලේකම්/ගණකාධිකාරී, මැලේරියා මර්ධන ව්‍යාපාරයේ අධිකාරීගේ ලේකම්/ගණකාධිකාරී, ක්ෂය රෝග මර්ධන ව්‍යාපාරයේ අධිකාරීගේ ලේකම්/ගණකාධිකාරී, වෛද්‍ය ආයතනයක් භාර යම්කිසි වෛද්‍ය නිලධාරියෙකු, දන්ත වෛද්‍ය විද්‍යාලයේ අධිපති, යම්කිසි රෝහල් ලේකම් වරයෙකු හෝ රෝහල් ලේකම් යනුවෙන් දෙපාර්තමේන්තුවෙහි නිල නාම ලැබී ඇති ආරෝග්‍යශාලා ලිපිකරු සේවයේ 1 වැනි ශ්‍රේණියේ ලිපිකරුවෙකු හෝ විසින් නම්, ජ්‍යෙෂ්ඨ පාලන ශ්‍රේණියෙහි අදාල වෛද්‍ය නිලධාරියා වෙත අභියාචනය කළ හැකිය.

2. මෙහි සඳහන් කිසිවක්, රාජ්‍ය සේවා විනය මණ්ඩලයට හෝ අමාත්‍යවරයාට හෝ අභියාචනය කිරීම පිණිස ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 119 වැනි වගන්තිය යටතේ ලැබී ඇති අයිතිවාසිකම් හීන කිරීමක් ලෙස හෝ ඊට බාධා වන්නක් ලෙස හෝ නොසැලකිය යුත්තේ ය. එසේ අර්ථනිරූපනය නොකළ ද යුක්තේ ය.

### උප ලේඛනය

| I | II |
|---|---|
| 1. වැටුප් ක්‍රමයේ ආරම්භක වාර්ෂික වැටුප රු. 6,720 ට අඩු සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙහි නියුතු (ඒකාබද්ධ සේවාවන්හි නියුක්ත නිලධාරීන් හැර ඉන් අන්‍යවූ) ඕනෑම රාජ්‍ය නිලධාරියෙකුගේ වැඩ තහනම් කිරීමේ බලය. | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ (පාලන)<br>නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ (වෛද්‍යසේවා)<br>නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ (මහජන සෞඛ්‍ය සේවා)<br>නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ (රසායනාගාර සේවා) |
| 2. වාර්ෂික වැටුප රු. 6,720 ට අඩු තමන්ගේ පාලන බලය යටතේ සිටින (ඒකාබද්ධ සේවාවන්හි නියුක්ත නිලධාරීන් හැර අන්‍යවූ) ඕනෑම රාජ්‍ය නිලධාරියෙකුගේ වැඩ තහනම් කිරීමේ බලය. | ජ්‍යෙෂ්ඨ පාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීනු<br>රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරී<br>විදුලි වෛද්‍ය ඉංජිනේරු |
| 3. වැටුප් ක්‍රමයේ ආරම්භක වාර්ෂික වැටුප රු. 6,720 ට අඩු සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙහි සේවයේ නියුතු (ඒකාබද්ධ සේවාවන්හි නියුක්ත නිලධාරීන් හැර ඉන් අන්‍ය වූ) ඕනෑම නිලධාරියෙකු සේවයෙන් පහ කිරීමේ, සාමාන්‍ය අකාර්යක්ෂමතාව සඳහා සේවයෙන් බලෙන් විශ්‍රාම ගැන්වීමේ, ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ තනතුරු අත්හැර ගියා සේ | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ (පාලන)<br>නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ (වෛද්‍ය සේවා)<br>නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ (මහජන සෞඛ්‍ය සේවා)<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ (රසායනාගාර සේවා) |

| I | II |
|---|---|
| සැලකීමේ, සේවය අවසන් කිරීමේ, නිලයෙන් පහළ දැමීමේ ජ්‍යෙෂ්ඨත්වයෙන් පහල දැමීමේ, වැටුප් අඩු කිරීමේ, වැටුප් වර්ධක අත් හිටුවීමේ, නතර කිරීමේ, අඩු කිරීමේ හෝ විලම්බනය කිරීමේ, තදින් තරවටු කිරීමේ, දඩනියම කිරීමේ, තරවටු කිරීමේ, අවවාද කිරීමේ හෝ දෙපාර්තමේන්තුව පිළිගත් වෙනත් සුළු දඬුවමක් පැණවීමේ බලය. | |
| 4. වැටුප් ක්‍රමයේ ආරම්භක වාර්ෂික වැටුප රු. 6,720 ට අඩු තමන්ගේ පාලන බලය යටතේ සිටින (ඒකාබද්ධ සේවාවන්හි නියුක්ත නිලධාරීන් හැර ඉන් අන්‍ය වූ) ඕනෑම රාජ්‍ය නිලධාරියෙකුට තරවටු කිරීමේ හෝ තදින් තරවටු කිරීමේ, සතියක වැටුපට නොවැඩි දඩයක් පැනවීමේ හෝ වැටුප් වර්ධකය වර්ෂයකට නොවැඩි කාලයකට අත් හිටුවීමේ, නතර කිරීමේ, අඩු කිරීමේ, හෝ විලම්බනය කිරීමේ, අවවාද කිරීමේ හෝ දෙපාර්තමේන්තුව පිළිගත් වෙනත් සුළු දඬුවමක් පැණවීමේ බලය. | ප්‍රධාන ගණකාධිකාරි,<br>ජ්‍යෙෂ්ඨ පාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීහු<br>රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි<br>විදුලි වෛද්‍ය ඉංජිනේරු<br>වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ හෝ<br>වෛද්‍ය පර්යේෂණායතනය භාර වෛද්‍ය නිලධාරි<br>ලාදුරු මර්ධන ව්‍යාපාරයේ අධිකාරි හෝ ලාදුරු මර්ධන ව්‍යාපාරය භාර වෛද්‍ය නිලධාරී. |
| 5. වැටුප් ක්‍රමයේ ආරම්භක වාර්ෂික වැටුප රු. 2,586 ට අඩු සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ඕනෑම නිලධාරියෙකු සේවයෙන් පහ කිරීමේ, සාමාන්‍ය අකාර්යක්ෂමතාව සඳහා සේවයෙන් බලෙන් විශ්‍රාම ගැන්වීමේ, ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ තනතුර අත් හැර ගියා සේ සැලකීමේ, සේවය අවසන් කිරීමේ, නිලයෙන් පහල දැමීමේ, ජ්‍යෙෂ්ඨත්වයෙන් පහල දැමීමේ වැටුප් අඩු කිරීමේ, වැටුප් වර්ධක අත් හිටුවීමේ, නතර කිරීමේ, අඩු කිරීමේ හෝ විලම්බනය කිරීමේ හෝ දඩ නියම කිරීමේ බලය. | ජ්‍යෙෂ්ඨ පාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීහු<br>රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරී<br>විදුලි වෛද්‍ය ඉංජිනේරු. |
| 6. වැටුප් ක්‍රමයේ ආරම්භක වාර්ෂික වැටුප රු. 2,586 ට අඩු තමන්ගේ පාලන බලය යටතේ සිටින නිලධාරින් සම්බන්ධයෙන් තරවටු කිරීමේ හෝ සතියක වැටුපට නොවැඩි දඩයක් පැණවීමේ හෝ බලය. | නියෝජ්‍ය පාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීහු<br>කාර්ය භාර වෛද්‍ය නිලධාරීහු<br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීහු<br>කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරීගේ ලේකම්<br>ඕනෑම සෞඛ්‍ය සේවා අධිකාරීවරයෙකුගේ ලේකම්/ගණකාධිකාරී.<br>මානසික සෞඛ්‍ය සේවා අධිකාරීගේ ලේකම්/ගණකාධිකාරී<br>මැලේරියා මර්ධන ව්‍යාපාරයේ අධිකාරීගේ ලේකම්/ගණකාධිකාරී.<br>ක්ෂය රෝග මර්ධන ව්‍යාපාරයේ අධිකාරීගේ ලේකම්/ගණකාධිකාරී.<br>දත් හෙද ඇබෑසි විදුහලේ අධිපති<br>සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රධාන ලිපිකරු හෝ ජ්‍යෙෂ්ඨ මුදල් ලිපිකරු<br>රෝහල් ලේකම්වරු හෝ රෝහල් ලේකම්වරුන් යනුවෙන් දෙපාර්තමේන්තුවෙන් නිල නම ලැබී ඇති ආරෝග්‍යශාලා ලිපිකරු<br>සේවයේ 1 වැනි ශ්‍රේණියේ ලිපිකරුවෝ.<br>වෛද්‍ය ආයතන භාර ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයෝ. |

11–517—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

එල්. ඕ.—බී. 7/63.

**1963 අංක 4 දරන දේශීය ආදායම් පනත**

**16අ වගන්තිය යටතේ දැන්වීම**

1969 අංක 6 දරන පනතින් සංශෝධිත, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම, "ධම්දූත පරිවෙණාරක්ෂක සහා අධ්‍යාපන අරමුදල" එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යායතනයක් යයි මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

1973 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ 1.

11–513—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**තේ ප්‍රචාරක ආඥාපනත (පරි. 169)**

තේ ප්‍රචාරක ආඥාපනතේ (169 පරිච්ඡේදය) 4 වැනි වගන්තිය යටතේ 1973 ඔක්තෝබර් මස 15 වැනි දින සිට අවුරුදු තුනක කාලයකට ලංකා තේ ප්‍රචාරක මණ්ඩලයේ කුඩා වතු හිමියන් නියෝජනය කිරීම සඳහා ජේ. ඒ. කරුණාසේන මහතා එකී මණ්ඩලයට නම් කිරීමට ගරු වැවිලි කර්මාන්ත ඇමතිතුමා සතුටු වන බැව් පොදු වශයෙන් දැනගැනීම පිණිස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩොරික් ද සූසා,
ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

1973 නොවැම්බර් මස 03 දින,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
කොළඹ 1.

11–543/1—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**තේ ප්‍රචාරක ආඥාපනත (පරි. 169)**

තේ ප්‍රචාරක ආඥාපනතේ (169 පරිච්ඡේදය) 4 වැනි වගන්තිය යටතේ 1973 ඔක්තෝබර් මස 15 වැනි දින සිට අවුරුදු තුනක කාලයකට ලංකා තේ ප්‍රචාරක මණ්ඩලයේ සුළු වෙළඳුන් නියෝජනය කිරීම සඳහා ජී. එල්. ඒ. චිචිට් මහතා එකී මණ්ඩලයට නම් කිරීමට ගරු වැවිලි කර්මාන්ත ඇමතිතුමා සතුටු වන බැව් පොදු වශයෙන් දැනගැනීම පිණිස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩොරික් ද සූසා,
ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

1973 නොවැම්බර් මස 03 දින,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
කොළඹ 1.

11–543/2—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

**තේ පර්යේෂණ ආඥාපනත (පරි. 438)**

තේ පර්යේෂණ ආඥාපනතේ (438 පරිච්ඡේදය) 5 වැනි වගන්තිය යටතේ 1973 ඔක්තෝබර් මස 15 වැනි දින සිට අවුරුදු තුනක කාලයකට තේ පර්යේෂණ මණ්ඩලයේ කුඩා වතු හිමියන් නියෝජනය කිරීම සඳහා ජෝන් ඇල්. රොබට්ස් මහතා එකී මණ්ඩලයට නම් කිරීමට ගරු වැවිලි කර්මාන්ත ඇමතිතුමා සතුටු වන බැව් පොදු වශයෙන් දැනගැනීම පිණිස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩොරික් ද සූසා,
ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

1973 නොවැම්බර් මස 03 දින,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.
කොළඹ 1.

11–541—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ 49 ඒ (1) වගන්තිය යටතේ කෙරෙන ආඥාවයි**

1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 49ඒ (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකම් හා ඉඩම් ඇමති හෙක්ටර් සෙනරත් රාජකරුණා බණ්ඩා කොබ්බෑකඩුව වන මම මෙහි පහත දක්වෙන උප ලේඛනයේ සඳහන් වන නිශ්චල දේපල කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් සඳහා ජාතික කිරි මණ්ඩලයට අවශ්‍ය වී ඇති බව මෙමගින් ප්‍රකාශයට පත් කරමි.

එච්. ඇස්. ආර්. බී. කොබ්බෑකඩුව,
කෘෂිකම් හා ඉඩම් ඇමති.

1973 ඔක්තෝබර් මස 31 දින,
කෘෂිකම් හා ඉඩම් අමාත්‍යාංශය,
315, වොක්ෂෝල් විදිය,
කොළඹ 2.

**උපලේඛනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ සොරණාතොට ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, උඩුවර, ග්‍රාමසේවක කොට්ඨාශයේ, උඩුවර ගමේ පිහිටි උඩුවර වතුයායෙන් අක්කර 01 ක් පමණ බිම් කැබැල්ලට මායිම්:

උතුරට : එම ඉඩමේ ඉතිරි බිම් කොටස ;

නැගෙනහිරට : බදුලු ඔය ;

දකුණට හා නැගෙනහිරට : බදුල්ල-බණ්ඩාරවෙල මහා මාර්ගය ආරක්ෂිත බිම් කොටස.

11–573—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**1971 අංක 52 දරණ වෙළඳ නැව් පනත**

1971 අංක 52 දරණ වෙළඳ නැව් පනතේ 6 වැනි වගන්තිය යටතේ නැව් හා සංචාරක කටයුතු ඇමතිතුමන් විසින්, 1973 නොවැම්බර් 07 වන දින සිට, ඩබ්ලිව්. ඩී. සොයිසා මහතා දිවයිනට පැමිණෙන තෙක්, ඒ. ගිරාගම මහතා වෙළඳ නැව් අධ්‍යක්ෂ වශයෙන් වැඩබැලීමට පත් කරනු ලැබ ඇති බැව් සියළු දෙනාගේම දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. බී. කරඳවල,
ලේකම්,
නැව් හා සංචාරක කටයුතු අමාත්‍යාංශය.

1973 නොවැම්බර් 05 දින,
නැව් හා සංචාරක කටයුතු අමාත්‍යාංශය,
කොළඹ 1.

11–728—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**මිල පාලන පනත**

මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විසින් පනවනු ලැබ 1973 සැප්තැම්බර් මස 29 වෙනි දින අංක 79/2 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද පහත සඳහන් මිල නියෝග විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යවරයා විසින් 1973. 10. 30 දින අනුමත කරනු ලැබූ බව, (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4(7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

(1) සුද්ධ නොකල දුඹුරු සීනි සහ සුද්ධ කළ සුදු සීනි පිළිබඳ අංක සී. 535 දරණ ආහාර මිල නියෝගය.
(2) තිරිඟු පිටි පිළිබඳ අංක සී. 536 දරණ ආහාර මිල නියෝගය.
(3) පාන් පිළිබඳ අංක සී. 537 දරණ ආහාර මිල නියෝගය.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973. ඔක්තෝබර් 31 දින,
කොළඹ.

11–524—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**සමගි මණ්ඩල පනත**

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ අංක 11/2 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම, ඒ වගන්ති යටතේ කරනු ලැබූ 1972 මැයි මස 5 වැනි දින අංක 15,009 දරන ගැසට් පත්‍රයේ පළ කෙරුණ ආඥාව මගින් මාතර දිස්ත්‍රික්කය තුළ පිහිටි අකුරැස්ස සුළු නගර සභා ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදයක සභාවේ (අ) ඡේදය යටතේ සඳහන් " 1. අකුරැස්ස පදිංචි කංකානම් පතිරණගේ පියදස මහතා " යන වචන වෙනුවට " 1. අකුරැස්ස පදිංචි පියදස පතිරණ මහතා " යන වචන හා (ආ) ඡේදය යටතේ සඳහන් " අකුරැස්ස පදිංචි කංකානම් පතිරණගේ පියදස මහතා " යන වචන වෙනුවට " අකුරැස්ස පදිංචි පියදස පතිරණ මහතා " යන වචන ආදේශ කර මෙයින් සංශෝධනය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 නොවැම්බර් මස 02 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

11–784—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**නිවැරදි කිරීම**

**ශ්‍රී ලංකා පරිපාලන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයට අංක 1 දරණ සංශෝධනය**

1973 අගෝස්තු මස 03 වන දින හා අංක 71 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ 793 වන පිටුවේ පලවූ දැන්වීමේ අංක 2 දරණ කොටසේ 4 වැනි පෙල "වන එක් වර්ෂයේ ජූනි මස 30 දිනට II වන පංතියේ" යනුවෙන් සංශෝධනය විය යුතුයි.

11–325—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

### සාප්පු සහ කාර්යාල සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත

### දැන්වීමයි

(129 වැනි අධිකාරය වන) සාප්පු සහ කාර්යාල සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙහි පහත සඳහන් කෙටුම්පත් තීරණය, එම තීරණයේ උපලේඛනයේ සඳහන් සෑම සාප්පුවකම සහ එම සාප්පුවලට අදාළ කාර්යාලවල නියුක්ත සේවකයින් වෙනුවෙන් පිහිටුවා ඇති වේතන විනිශ්චය මණ්ඩලය විසින් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කෙටුම්පත් තීරණයට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරුද්ධතාවයන් 1973 නොවැම්බර් 30 වැනි දින දවල් 12 දක්වා වේතන විනිශ්චය මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන ඒ සෑම විරුද්ධතාවයක්ම එසේ විරුද්ධවීමට හේතුවූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතුය.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
ඉහත සඳහන් සාප්පුවල සහ ඒවාට අදාළ කාර්යාලවල සේවයේ යෙදී ඇති සේවකයින් සඳහාවූ වේතන විනිශ්චය මණ්ඩලයේ සභාපති.

1973 නොවැම්බර් 05 වැනි දින,
කොළඹ 5, කම්කරු දෙපාර්තමේන්තුවේ දීය.

### කෙටුම්පත් තීරණය

1. මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් එක් එක් සාප්පුවක සහ එම සාප්පුවලට අදාළ කාර්යාලවල, සේවයේ නියුක්ත මෙහි පහත නිශ්චිතව සඳහන් සේවක පංතිවලට මේ තීරණය අදාළ විය යුතුය :—

(1) අයකැමියෝ, පොත් තබන්නෝ සහ ගබඩා භාරකරුවෝ ;

(2) ලිපිකරුවෝ, ලඝුලේඛකයෝ සහ කොම්ප්ටොමීටර් ක්‍රියාකරුවෝ ;

(3) යතුරු ලේඛකයෝ සහ දුරකථන ක්‍රියාකරුවෝ ;

(4) විකුණුම්කාරියන් ද ඇතුළුව වෙළඳ සේවකයෝ ;

(5) කවුන්ටරයේ සේවය කරන ළමෝ, ඇහුරුම්කරුවෝ, කාර්යාල කාර්ය සහායකයෝ, පණිවුඩකරුවෝ, තේ සපයන ළමෝ, වෙකර්වරු සහ කම්කරුවෝ.

2. පළවෙනි ඡේදයේ සඳහන් යම් සාප්පුවක සහ කාර්යාලයක සේවයෙහි යොදවා ඇති යම් සේවකයකු සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය පහත සඳහන් ආකාරයට විය යුතුය:—

#### මාසයක් සඳහා ගෙවියයුතු අවම වේතන ප්‍රමාණය

| සේවා වර්ෂය | සේවක පන්තිය: අයකැමියෝ, පොත් තබන්නෝ සහ ගබඩා භාරකරුවෝ | | ලිපිකරුවෝ, ලඝුලේඛකයෝ සහ කොම්ප්ටොමීටර් ක්‍රියාකරුවෝ | | යතුරු ලේඛකයෝ සහ දුරකථන ක්‍රියාකරුවෝ | | විකුණුම්කාරියන් ද ඇතුළුව වෙළඳ සේවකයෝ | | කවුන්ටරයේ සේවය කරන ළමෝ, ඇහුරුම්කරුවෝ, කාර්යාල කාර්ය සහායකයෝ, පණිවුඩකරුවෝ, තේ සපයන ළමෝ වෙකර්වරු සහ කම්කරුවෝ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. |
| රැකියාවේ යෙදී ඇති 1 වෙනි වර්ෂය තුළ ... | 225 | 0 | 190 | 0 | 170 | 0 | 155 | 0 | 135 | 0 |
| රැකියාවේ යෙදී ඇති 2 වෙනි වර්ෂය තුළ ... | 235 | 0 | 200 | 0 | 180 | 0 | 165 | 0 | 140 | 0 |
| රැකියාවේ යෙදී ඇති 3 වෙනි වර්ෂය තුළ ... | 245 | 0 | 210 | 0 | 190 | 0 | 175 | 0 | 145 | 0 |
| රැකියාවේ යෙදී ඇති 4 වෙනි වර්ෂය තුළ ... | 255 | 0 | 220 | 0 | 200 | 0 | 185 | 0 | 150 | 0 |
| රැකියාවේ යෙදී ඇති 5 වෙනි වර්ෂය තුළ ... | 265 | 0 | 230 | 0 | 210 | 0 | 195 | 0 | 155 | 0 |
| රැකියාවේ යෙදී ඇති 6 වෙනි වර්ෂය තුළ ... | 275 | 0 | 240 | 0 | 220 | 0 | 205 | 0 | 160 | 0 |
| රැකියාවේ යෙදී ඇති 7 වෙනි වර්ෂය තුළ | 285 | 0 | 250 | 0 | 230 | 0 | 215 | 0 | 165 | 0 |
| රැකියාවේ යෙදී ඇති 8 වෙනි වර්ෂය තුළ ... | 295 | 0 | 260 | 0 | 240 | 0 | 225 | 0 | 170 | 0 |
| රැකියාවේ යෙදී ඇති 9 වෙනි වර්ෂය තුළ ... | 305 | 0 | 270 | 0 | 250 | 0 | 235 | 0 | 175 | 0 |
| රැකියාවේ යෙදී ඇති 10 වෙනි වර්ෂය තුළ ... | 315 | 0 | 280 | 0 | 260 | 0 | 245 | 0 | 180 | 0 |
| රැකියාවේ යෙදී ඇති 11 වෙනි වර්ෂය තුළ ... | 325 | 0 | 290 | 0 | 270 | 0 | 255 | 0 | 185 | 0 |
| රැකියාවේ යෙදී ඇති 12 වෙනි වර්ෂය තුළ ... | 340 | 0 | 305 | 0 | 285 | 0 | 270 | 0 | 190 | 0 |
| රැකියාවේ යෙදී ඇති 13 වෙනි වර්ෂය තුළ ... | 355 | 0 | 320 | 0 | 300 | 0 | 285 | 0 | 195 | 0 |
| රැකියාවේ යෙදී ඇති 14 වෙනි වර්ෂය තුළ ... | 370 | 0 | 335 | 0 | 315 | 0 | 300 | 0 | 202 | 50 |
| රැකියාවේ යෙදී ඇති 15 වෙනි වර්ෂය තුළ ... | 385 | 0 | 350 | 0 | 330 | 0 | 315 | 0 | 210 | 0 |
| රැකියාවේ යෙදී ඇති 16 වෙනි වර්ෂය තුළ ... | 400 | 0 | 365 | 0 | 345 | 0 | 330 | 0 | 217 | 50 |
| රැකියාවේ යෙදී ඇති 17 වෙනි වර්ෂය තුළ ... | 415 | 0 | 380 | 0 | 360 | 0 | 345 | 0 | 225 | 0 |
| රැකියාවේ යෙදී ඇති 18 වෙනි වර්ෂය තුළ ... | 430 | 0 | 395 | 0 | 375 | 0 | 360 | 0 | 232 | 50 |
| රැකියාවේ යෙදී ඇති 19 වෙනි වර්ෂය තුළ ... | 445 | 0 | 410 | 0 | 390 | 0 | 375 | 0 | 240 | 0 |
| රැකියාවේ යෙදී ඇති 20 වෙනි වර්ෂය තුළ ... | 460 | 0 | 425 | 0 | 405 | 0 | 390 | 0 | 247 | 50 |
| රැකියාවේ යෙදී ඇති 21 වෙනි වර්ෂය තුළ ... | 475 | 0 | 440 | 0 | 420 | 0 | 405 | 0 | 255 | 0 |
| රැකියාවේ යෙදී ඇති 22 වෙනි වර්ෂය තුළ ... | 475 | 0 | 440 | 0 | 420 | 0 | 425 | 0 | 262 | 50 |
| රැකියාවේ යෙදී ඇති 23 වෙනි වර්ෂය තුළ ... | 475 | 0 | 440 | 0 | 420 | 0 | 445 | 0 | 270 | 0 |
| රැකියාවේ යෙදී ඇති 24 වෙනි වර්ෂය තුළ ... | 475 | 0 | 440 | 0 | 420 | 0 | 465 | 0 | 270 | 0 |
| රැකියාවේ යෙදී ඇති 25 වෙනි වර්ෂය තුළ ... | 475 | 0 | 440 | 0 | 420 | 0 | 485 | 0 | 270 | 0 |
| රැකියාවේ යෙදී ඇති 26 වෙනි වර්ෂය සහ ඊට පසු සෑම වර්ෂයක් තුළ ... ... ... | 475 | 0 | 440 | 0 | 420 | 0 | 505 | 0 | 270 | 0 |

3. මේ තීරණයේ 2 වැනි ඡේදයේ සඳහන් "1 වැනි සේවා වර්ෂය" යන පාඨයෙන් යම් සේවායකු යටතේ සේවය පිළිබඳව, එම සේවායා යටතේ සේවකයකු පළමුවෙන් සේවය ආරම්භ කළ දින සිට නොකඩවා මාස 12 ක කාලයක් අදහස් වේ.

4. මේ තීරණය සඳහා—

(1) "විකුණුම්කරුවෙකු" යනුවෙන් (129 වන අධිකාරය වන) සාප්පු සහ කාර්යාල සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ අර්ථානුකූලව පාරිභෝගිකයින්ට වෙළඳම් කටයුතු කිරීමේ කාර්යය සඳහා යොදවා ඇති තැනැත්තෙක් අදහස් වේ.

(2) "ලිපිකරුවකු" යනුවෙන් යතුරු ලිවීම සහ ගිණුම් වැඩ ඇතුළු සම්පූර්ණ හෝ ප්‍රධාන වශයෙන් ලිපිකාර වැඩෙහි නියුක්ත තැනැත්තෙක් අදහස් වේ.

(3) "අයකැමියකු" යනුවෙන් සම්පූර්ණ හෝ ප්‍රධාන වශයෙන් මුදල් භාරගැනීමට සහ/හෝ ගෙවීමට මුදල් භාරව සිටීමට අවශ්‍ය වාර්තා සහ පොත්පත් පවත්වාගෙන යාමට සහ විධාන කළ විට මුදල් බැංකුවේ තැන්පත් කිරීමේ නියුක්ත වීමට යොදවනු ලබන තැනැත්තෙක් අදහස් වේ.

(4) "පොත් තබන්නා" යනුවෙන් සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් සාප්පුවක සහ / හෝ කාර්යාලයක අයවැය පත්‍රය පිළියෙල කිරීම ඇතුළු ගිණුම් පිළිබඳ පොත්පත් පවත්වාගෙන යන සේවකයා අදහස් වෙයි.

(5) "දුරකථන ක්‍රියාකරුවකු" යනුවෙන් සම්පූර්ණ හෝ ප්‍රධාන වශයෙන් දුරකථන යන්ත්‍ර පුවරු ක්‍රියා කරවීමට, දුරකථනයෙන් ඇමතුම් කිරීමට හ ලබාගැනීමට, දුරකථන විමසුම්වලට පිළිතුරු දීමට හා ඊට අදාළ වාර්තා පවත්වාගෙන යාමට යොදවනු ලබන තැනැත්තෙක් අදහස් වේ.

(6) "ගබඩාකරුවකු" යනුවෙන් තොග වශයෙන් බඩු ගබඩා කර ඇති ගබඩා කාමරයක් භාරව සිටීමට යොදවා ඇති හා එවැනි ගබඩා කිරීමේ කටයුතු වලට අදල පොත්පත් සහ වාර්තා පවත්වා ගැනීමට වගකිව යුතු තැනැත්තෙක් අදහස් වේ.

(7) "කම්කරුවකු" යනුවෙන් ඕනෑම නුපුහුණු කාර්‍යයක් කිරීමට යොදවා ඇති තැනැත්තෙක් අදහස් වේ.

(8) "යතුරු ලේඛක" යනුවෙන් සම්පූර්ණ හෝ ප්‍රධාන වශයෙන් යතුරු ලිවීමේ කාර්යයන්හි නිරතවන තැනැත්තෙක් අදහස් වේ.

## උපලේඛනය

| | | |
|---|---|---|
| 1. | අජන්තා පොත්හල ... ... | ... 7, මල්වත්ත පාර, කොළඹ 11 |
| 2. | අප්වාඩ් බුක් ෂොප් ... ... | ... 516, දෙවැනි මරදන, කොළඹ 10 |
| 3. | ආනන්ද පොත්හල ... ... | ... 148, ගාලුපාර, වැල්ලවත්ත, කොළඹ 6 |
| 4. | අශෝකා ට්‍රේඩිං කොම්පැනි පොත්හල ... | ... 183, ගාලුපාර, බම්බලපිටිය, කොළඹ 4. |
| 5. | එම්. බින්අහමඩ් සහ සමාගම, පොත්හල ... | ... 393, ගාලුපාර, වැල්ලවත්ත කොළඹ 6 |
| 6 | ක්‍රිස්තියානි සාහිත්‍ය සමාගම පොත්හල ... | ... 1, කන්සිස්ටරි බිල්ඩින්, මල්වත්ත පාර, කොළඹ 11 |
| 7. | සීමාසහිත කාගිල්ස් (ලංකා) පොත්හල ... | ... 34—48, යෝක් වීදිය, කොළඹ 1 |
| 8. | කැතලික් පොත්හල ... ... | ... 159, ඕල්කට් මාවත, කොළඹ 11 |
| 9. | සීමාසහිත එච්. ඩබ්ලිව්. කේව් සහ සමාගම පොත්හල | ..., 81, සර් බාරොන් ජයතිලක මාවත, කොළඹ 1 |
| 10. | සීමාසහිත කලම්බු ඇපොතිකරිස් පොත්හල ... | ... තැ.පෙ. 31, කොළඹ 1 |
| 11. | සීමාසහිත කලම්බු ඇපොතිකරිස් පොත්හල ... | ... 84, කෙලින් වීදිය, පිටකොටුව, කොළඹ 11 |
| 12. | ක්‍රිස්තියානි සාහිත්‍ය සමාගම පොත්හල ... | ... 60, ගාලුපාර, වැල්ලවත්ත, කොළඹ 6 |
| 13. | ඩැනියල්ස් බුක් ෂොප් ... ... | ... 287, ගාලුපාර, වැල්ලවත්ත, කොළඹ 6 |
| 14. | දයාවංශ ජයකොඩි සහ සමාගම පොත්හල ... | ... 101, ඇවන්ඩල් පාර, මරදන, කොළඹ 10 |
| 15. | ධර්මදස සහෝදරයෝ පොත්හල ... | ... 203, ගාලුපාර, බම්බලපිටිය, කොළඹ 4 |
| 16. | සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම පොත්හල | ... ඕල්කට් මාවත, කොළඹ 11 |
| 17. | ජනතා පොත්හල ... ... | ... 23, ඩී. ඇස්. සේනානායක මාවත, කොළඹ 8 |
| 18. | ලේක් හවුස් පොත්හල ... ... | ... 100, සර් චිත්තම්පලම් ගාඩිනර් මාවත, කොළඹ 2 |
| 19. | ලෝටස් බුක් ෂොප් ... ... | ... 677, දෙවැනි මරදන, කොළඹ 10 |
| 20. | මැකලම් පොත්හල ... ... | ... 77, ඕල්කට් මාවත, කොළඹ 11 |
| 21. | නිව් කලම්බු බුක් ඩිස්ට්‍රිබියුටර්ස් පොත්හල ... | ... 445, මරදන පාර, කොළඹ 10 |
| 22. | මහජන ප්‍රකාශකයෝ පොත්හල ... | ... 124, කුමාරරත්නම් පාර, කොළඹ 2 |

| | | |
|---|---|---|
| 23. | ජී. ඒ. පෙරේරා සහ සමාගම පොත්හල | 438, මරදන පාර, කොළඹ 10 |
| 24. | පිට්‍රාබැන් පොත්හල | 118, ගාලුපාර, බම්බලපිටිය, කොළඹ 4 |
| 25. | පියසිරි ස්ටෝර්ස් පොත්හල | 578, දෙමටගොඩ පාර, කොළඹ 9 |
| 26. | රඝුනාතන් පදිප්පගම් පොත්හල | 303, ගාලුපාර, කොළඹ 3 |
| 27. | රත්න පොත් ප්‍රකාශකයෝ පොත්හල | 513, දෙවැනි මරදන, කොළඹ 10 |
| 28. | රත්නා ස්ටෝර්ස් පොත්හල | 130, මැලේ වීදිය, කොළඹ 2 |
| 29. | රත්නාකර පොත් වෙළඳසැල | 74, වෙල්ල වීදිය කොළඹ 12 |
| 30. | රත්නාවලී ප්‍රකාශකයෝ පොත්හල | 231 ඕල්කට් මාවත, කොළඹ 11 |
| 31. | රෝහන පොත්හල | 433, ගාලු පාර, බම්බලපිටිය, කොළඹ 4 |
| 32. | සදීක් පොත්හල | 18බී, මල්වත්ත පාර, කොළඹ 11 |
| 33. | සලාක පොත්හල | 455, යූනියන් පෙදෙස, කොළඹ 2 |
| 34 | සමන් පොත්හල | 330, ගාලු පාර, බම්බලපිටිය, කොළඹ 4 |
| 35. | සමයවර්ධන පොත්හල | 53, මාලිගාකන්ද පාර, කොළඹ 10 |
| 36. | කේ. වී. ජී. ද සිල්වා සහ පුත්‍රයෝ පොත්හල | 44/9, තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 37. | කේ. වී. ජේ. ද සිල්වා සහ පුත්‍රයෝ පොත්හල | 415, ගාලුපාර, බම්බලපිටිය, කොළඹ 4 |
| 38. | ශ්‍රී ලංකා පබ්ලිෂිං කොම්පැණි පොත්හල | 209, ඕල්කට් මාවත, කොළඹ 11 |
| 39. | සූරියා බුක්ෂොප් | 388, ගාලුපාර, වැල්ලවත්ත, කොළඹ 6 |
| 40. | තම්බිතුරේ සහ පුත්‍රයෝ පොත්හල | 85, ලෝරිස් පාර, බම්බලපිටිය, කොළඹ 4 |
| 41. | විද්‍යාධාර පොත්හල | 531, දෙවැනි මරදන, කොළඹ 10 |
| 42. | වික්ස් බුක් ඩිපෝ | 503, දෙවැනි මරදන, කොළඹ 10 |
| 43. | විජයලක්ෂ්මි බුක් ඩිපෝ | 248, ගාලුපාර, වැල්ලවත්ත, කොළඹ 6 |

11–659—73.11.16 දින අංක 86 දරන ගැසට් පත්‍රය

---

**ධීවර ආඥාපනත (212 වැනි අධිකාරය)**

කහව-බණ්ඩරවත්ත ධීවර ආරවුල

යථොක්ත ධීවර ආරවුල පිළිබඳව ප්‍රසිද්ධ විභාගය පැවැත්වූ ජේ. ඩී. එල්. ස්වාරිස් මහතාගේ වාර්තාව 1973 නොවැම්බර් මස 17 වෙනි දින පෙ. ව. 10 ට කොළඹ, ගාළුමුවදොර, ධීවර දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ශාලාවේදී කියවනු ලබන බව, ආරවුලට සහභාගි පක්ෂයන්ගේ හා එය පිළිබඳව උනන්දුවක් දක්වන අනිකුත් අයගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

ඒ. අයි. මොහිදීන්,
ධීවර අධ්‍යක්ෂ.

1973 නොවැම්බර් මස 02 දිනැදී,
කොළඹ දීය.

1–527—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**1974 වර්ෂය සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර අළුත් කිරීම**

1974 වර්ෂය සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර අළුත් කිරීම 1973 දෙසැම්බර් මස 01 වැනි දින සිට ආරම්භ වේ. 1973 වර්ෂය සඳහා තුවක්කු ළඟ තබා ගැනීමට හා පාවිච්චි කිරීමට බලපත්‍ර දරන්නන්, ඔවුන් පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායසීලයෙන් බලපත්‍ර අළුත් කරවා ගත යුතුයි. ප්‍රාදේශීය උප දිසාපති සහ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කායසීල මගින් 1974 මාර්තු 31 වැනි දින දක්වා බලපත්‍ර අළුත් කෙරේ. ඉන් පසු බලපත්‍ර අළුත් කෙරෙන්නේ හම්බන්තොට දිසාපති කායසීලය මගින්ය.

2. බලපත්‍ර ගාස්තු වශයෙන් මුද්දර භාරගනු නොලැබේ. පසුගිය වර්ෂය වෙනුවෙන් ලබා ඇති බලපත්‍රය නැතිවීනම් ඒ වෙනුවට රුපිය ලක් ගෙවා නැතිවීමේ සහතිකයක් ප්‍රාදේශීය උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරිගෙන් ලබාගත යුතුය. පැරණි බලපත්‍රය හෝ එහි නැතිවීමේ සහතිකයක් ඉදිරිපත් නොකරන අයට අළුත් බලපත්‍ර නිකුත් කරනු නොලැබේ. 1973 දෙසැම්බර් 31 වැනි දිනට ප්‍රථමයෙන් නව වර්ෂය සඳහා බලපත්‍රයක් ලබා නොගත් අයට බලපත්‍ර ගාස්තුවලට සමාන දඩ මුදලකට යටත් වීමට සිදුවේ.

3. ඉහත සහන් කාලසීමාව තුළදී බලපත්‍ර අළුත් කිරීම හම්බන්තොට දිසාපති කායසීලයේදී සිදු නොකෙරේ.

4. අළුත් කිරීම සඳහා ඉදිරිපත් කරන බලපත්‍රවල සඳහන් සෑම තුවක්කුවක්ම එම බලපත්‍ර අළුත් කිරීමට පෙර බලපත්‍ර නිකුත් කරන නිලධාරියා වෙත පරීක්ෂණය පිණිස ඉදිරිපත් කළ යුතුයි. කිසියම් තුවක්කුවක් පාවිච්චි කළ නොහැකි තත්වයක තිබේ නම් 1973 වර්ෂය සඳහා නිකුත් කර තිබෙන බලපත්‍රය සමඟ අදාළ ප්‍රාදේශීය උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි වෙත 1973. 12. 31 වැනි දිනට ප්‍රථම භාරදිය යුතුයි. එසේ නොකළහොත් 1974 වර්ෂයට ද බලපත්‍රයක් ලබා ගැනීමට සිදුවේ.

5. මෙසේ බලපත්‍ර අළුත් නොකළ අයට විරුද්ධව නීති මාර්ගයෙන් දඬුවම් පැමිණවීමට 74. 03. 31 වැනි දිනෙන් පසුව ක්‍රියා කරනු ඇත.

ඩී. එච්. ජේ. අබේගුණසේකර,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ඔක්තෝබර් මස 30 වැනි දින,
හම්බන්තොට දිසාපති කායසීලයේ දීය.

11–556—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

**මන්නාරම දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර 1974 වර්ෂය සඳහා අළුත් කිරීම**

1974 වර්ෂය සඳහා මන්නාරම දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර අළුත් කිරීම ඒ ඒ කොට්ඨාශවල ප්‍රාදේශීය උප දිසාපතිවරුන් හා ප්‍රා. ආ. නි. විසින් 1973 දෙසැම්බර් මස 1 වෙනි දින සිට 1973 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා කරනු ලබන බව තුවක්කු අයිතිකරුවන්ට මෙයින් දැනුම් දෙනු ලැබේ. බලපත්‍ර අළුත් කිරීමේ දී ඒ සඳහා 1973 අවුරුද්දේ බලපත්‍රයද, තුවක්කුවද බලපත්‍ර ගාස්තුව සමග ඉදිරිපත් කළ යුතුය. 1973 අවුරුද්දට නිකුත් කරන ලද බලපත්‍රයක් ළඟ නොමැති නම් එවැනි බලපත්‍රයක් සඳහා නියමිත බලපත්‍ර ගාස්තුව සමග තවත් වැඩිපුර රුපියලක්ද ගෙවිය යුතුය. 1973 දෙසැම්බර් මස 31 වෙනි දිනට හෝ ඊට ප්‍රථම හෝ බලපත්‍ර අළුත්කර ගැනීමට නොහැකි වුවත්ට බලපත්‍රයක නියමිත කාලයෙන් පසුව අළුත් කිරීමේදී බලපත්‍ර ගාස්තුව මුදලට සමාන අතිරේක දඩ මුදලක් ගෙවා අළුත් කර ගන්නට සිදුවේ. ප්‍රාදේශීය උප දිසාපතිවරුන් විසින් 1974 මාර්තු මස 31 වෙනි දින දක්වා මෙම දඩ මුදල් අයකර ගැනීම සමගම බලපත්‍ර අළුත් කිරීමද කරගෙන යනු ලැබේ. ඉන්පසු බලපත්‍ර අළුත් කිරීම කච්චේරියේදී සිදු කරනු ලැබේ. 1974 මාර්තු 31 වෙනි දිනට හෝ ඊට ප්‍රථම තුවක්කු බලපත්‍ර අළුත් කර නොගන්නා අයට විරුද්ධව නඩු පවරන බවද සැලකිය යුතුයි. බලපත්‍ර ගාස්තු සඳහා මුද්දර භාරගනු නොලැබේ.

2. යම්කිසි හේතුවකින් තුවක්කුවක් පාවිච්චියට නුසුදුසු නම්, එම තුවක්කුවද 1973 වර්ෂයට එම තුවක්කුව සඳහා නිකුත් කරන ලද බලපත්‍රයද කච්චේරියට හෝ බලපත්‍ර අයිතිකරුවන් පදිංචි ඒ ඒ ප්‍රදේශවල ප්‍රාදේශීය උප දිසාපතිවරුන් වෙත භාර දිය යුතුයි. එසේ නොමැති නම් බලපත්‍රකරුවන් විසින් බලපත්‍රයට නියමිත ගාස්තු ගෙවා 1973 වර්ෂයට බලපත්‍ර ලබාගත යුතුයි.

3. තුවක්කු අයිතිකරුවන් විසින් පලපත්‍ර අළුත් කිරීමේදී පරීක්ෂා කිරීම සඳහා තුවක්කුද ඉදිරිපත් කළ යුතුයි.

එස්. කදිර්කාමනාදන්,
මන්නාරම දිසාපති.

1973. 11. 2
මන්නාරම දිසාපති කාර්යාලයේ දීය.

11–578—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**මඩකලපු දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර අළුත් කිරීම — 1974 වර්ෂය**

මඩකලපු දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර 1974 වර්ෂය සඳහා අළුත් කිරීම, ඒ ඒ කොට්ඨාශවල ප්‍රාදේශීය උප දිසාපතිවරුන් සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් විසින් 1973 දෙසැම්බර් මස 1 වැනි දින සිට කරනු ලබන බැව් මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. 1973 දෙසැම්බර් මස 31 වැනි දිනට පෙර තමන්ගේ තුවක්කු බලපත්‍ර අළුත් කර ගන්නා ලෙස මහජනයාට මෙයින් උපදෙස් දෙමි. 1974 වර්ෂය සඳහා බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම 1973 වර්ෂය සඳහා වූ බලපත්‍ර ද, සෝදිසි කිරීම සඳහා ඒ බලපත්‍රවල සඳහන් තුවක්කු ද සියලුම බලපත්‍රධාරීන් විසින් ඒ ඒ කොට්ඨාශ භාර ප්‍රාදේශීය උප දිසාපතිවරුන් සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුවේ.

3. 1973 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් පසුව ලැබෙන සියලුම අයදුම් පත් භාර ගනු ලබනුයේ බලපත්‍ර ගාස්තුව මෙන් 100% ක දඩ මුදලකට යටත්වය. තමන් සතුව ඇති තුවක්කු පාවිච්චියට නුසුදුසු තත්ත්වයක තිබීම නිසා හෝ වෙනයම් හේතුවක් නිසා හෝ සිය බලපත්‍රය 1974 වර්ෂය සඳහා අළුත් නොකිරීමට තීරණය කර ඇති සියලුම තුවක්කු බලපත්‍ර හිමියන්, ඒ තුවක්කු අදාළ බලපත්‍රයන් සමග අවස්ථාවෝචිත පරිදි ප්‍රාදේශීය උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරී හෝ මා හෝ වෙත 1973 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට පෙර භාර දිය යුතුවේ.

4. 1974 මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම තුවක්කු බලපත්‍ර අළුත් කර නොගන්නා අයට විරුද්ධව නඩු පවරනු ලැබේ.

ආර්. බී. වීරකෝන්,
මඩකලපු පාලන දිස්ත්‍රික්කයේ දිසාපති
හා බලපත්‍ර අධිකාරී.

1973 ඔක්තෝබර් මස 31 දින,
මඩකලපුව දිසාපති කායර්‍යාලයේ දීය.

11–623—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**පිස්සු බලු උවදුර**

බදුල්ල දිස්ත්‍රික්කයේ දැනට බල්ලන්ගෙන් අන්තරා සිදුවන බැවින්, බල්ලන් සම්බන්ධ ආඥාපනතේ අංක 476 දරණ පරිච්ඡේදයේ අංක 11 දරණ වගන්තිය යටතේ 1973 නොවැම්බර් මස 1 දා සිට මාස හයකට එම පළාත, බදුල්ල මහ නගර සභාව, බණ්ඩාරවෙල සහ හපුතලේ නගර සභා සහ ලුණුගල, පස්සර, වැලිමඩ හා හාලිඇල සුළු නගර සභාවලට අයත් ප්‍රදේශ හැර පිස්සු බලු රෝගයට යටත් ප්‍රදේශයන් ලෙස ප්‍රකාශ කරන බව මෙයින් දැනුම් දෙමි.

2. එබැවින් බදුල්ල දිස්ත්‍රික්කයේ ඉහත ප්‍රකාශයට යටත් ප්‍රදේශය තුළ, නොබඳින ලද හෝ අල්ලා නොගෙන යන බල්ලෙක්, යම් කෙනෙකුගේ ගෙදරක හෝ වත්තක හැර ප්‍රසිද්ධ ස්ථානයක, පාරක හෝ වෙනයම් ස්ථානයක සිටියහොත් ඌ වහාම මරා දැමීමට පුළුවන් බව මෙයින් දන්වනු ලැබේ.

ආර්. අබේරත්න,
බදුල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1973 නොවැම්බර් 5 වෙනි දින,
බදුල්ල කච්චේරියේ දී ය.

11–687—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

අංකය : ආර්/1243/පී. 97.

**1962 සේ අංක 21 දරණ වකුෆ් (සංශෝධන) පනතින් සංශෝධිත 1956 යේ අංක 51 දරණ වකුෆ් පනත**

කන්නියා, උණු දිය පොකුණ අසල පිහිටි පල්ලිය හා සිද්ධස්ථානය ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් කර නොමැති බැවින්, වකුෆ් මංඩලය විසින් 1973 ඔක්තෝබර් මස 20 වන දින, කොළඹ පිහිටි මුස්ලිම් පල්ලි හා පුණ්‍යාධාර භාර දෙපාර්තමේන්තුවේ දී පවත්වන ලද රැස්වීමකදී, එකී පල්ලිය හා සිද්ධස්ථානය, 1962 සේ අංක 21 දරණ (සංශෝධන) වකුෆ් පනතින් සංශෝධිත 1956 යේ අංක 51 දරණ වකුෆ් පනතේ 13 බී දරණ වගන්තිය යටතේ ලියාපදිංචි කළ යුතු යයි තීරණය කරන ලදී.

යෝජිත ලියාපදිංචි කිරීම ගැන විරුද්ධතාවයන්, 1973 දෙසැම්බර් මස 14 වන දින හෝ ඊට පෙර, වකුෆ් මංඩලය විසින් පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කිරීමෙන් භාර ගනු ඇත.

එවැනි සෑම විරුද්ධතාවයක්ම ලියවිල්ලක් මඟින් ඉදිරිපත් කළ යුතු අතර, විරුද්ධතාවය පළ කිරීමට හේතු දැක්වෙන ප්‍රකාශනයක් ද එහි විය යුතුය.

එම්. අයි. එම්. නාලීර්,
මුස්ලිම් පල්ලි හා පුණ්‍යාධාර භාර කොමසාරිස්,

1973 නොවැම්බර් මස 16 වන දින,
කොළඹ 5,
තැ. පෙ. 543, අංක සී 47 කැප්පෙටිපොල පාරේ,
මුස්ලිම් පල්ලි හා පුණ්‍යාධාර භාර දෙපාර්තමේන්තුවේ දී ය.

11–570—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

අංකය : ආර්/682/ටී. 36.

**1962 යේ අංක 21 දරණ වකුප් (සංශෝධන) පනතින් සංශෝධිත 1956 යේ අංක 51 දරන වකුප් පනත**

ත්‍රිකුණාමලය, උතුරු වෙරළබඩ පාරේ පිහිටි මුහියියදීන් ආණ්ඩවර් පල්ලිය ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් කර නොමැති බැවින්, වකුප් මංඩලය විසින් 1973 ඔක්තෝබර් මස 20 වන දින, කොළඹ පිහිටි මුස්ලිම් පල්ලි හා පුණ්‍යාධාර භාර දෙපාර්තමේන්තුවේ දී පවත්වන ලද රැස්වීමක දී, එකී මුහියියදීන් ආන්ඩවර් පල්ලිය, 1962 යේ අංක 21 දරණ (සංශෝධන) වකුප් පනතින් සංශෝධිත 1956 යේ අංක 51 දරණ වකුප් පනතේ 13බී දරණ වගන්තිය යටතේ ලියාපදිංචි කළ යුතු යයි තීරණය කරන ලදී.

යෝජිත ලියාපදිංචි කිරීම ගැන විරුද්ධතාවයන්, 1973 දෙසැම්බර් මස 14 වන දින හෝ ඊට පෙර, වකුප් මංඩලය විසින් පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කිරීමෙන් භාර ගනු ඇත.

එවැනි සෑම විරුද්ධතාවයක් ම ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතු අතර, විරුද්ධතාවය පළ කිරීමට හේතු දැක්වෙන ප්‍රකාශනයක් ද එහි විය යුතුය.

එම්. අයි. එම්. නාලීර්,
මුස්ලිම් පල්ලි හා පුණ්‍යාධාර භාර කොමසාරිස්,

1973 නොවැම්බර් මස 16 වන දින,
කොළඹ 5,
තැ. පෙ. 543, අංක සී 47 කැප්පෙටිපොල පාරේ
මුස්ලිම් පල්ලි හා පුණ්‍යාධාර භාර දෙපාර්තමේන්තුවේ දී ය.

11–571—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

අංක 451

**1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත**

2 (1) වැනි වගන්තිය යටතේ ආඥාව

1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 2 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්, රාජගුරු බණ්ඩාර රාජගුරු වන මම, මෙහි වූ පළමුවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ('' ඒකාබද්ධ වන සමිති '' යනුවෙන් හැඳින්වෙන) සමිති මෙහි වූ දෙවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ('' ප්‍රධාන සමිතිය '' යනුවෙන් හැඳින්වෙන) සමිතිය සමග 1973 නොවැම්බර් මස 22 වැනි දින සිට ක්‍රියාත්මක වන සේ මෙම ආඥාවෙන් ඒකාබද්ධ කරමි.

1973 නොවැම්බර් මස 5 වැනි දින,
කොළඹ 1,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ දී ය.

රා. බ. රාජගුරු,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්.

**පළමුවෙනි උපලේඛනය**

ඒකාබද්ධ වන සමිති :—

| | සමිතියේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි කළ දිනය |
|---|---|---|---|
| 1. | සීමාසහිත හෙට්ටිපොල විවිධ සේවා සමුපකාර සමිතිය ... ... ... ... | කුලි. 82 ... | 1971.02.13 |
| 2. | සීමාසහිත මොරගනේ විවිධ සේවා සමුපකාර සමිතිය ... ... ... ... | කුලි. 83 ... | 1971.02.13 |

**දෙවෙනි උපලේඛනය**

ප්‍රධාන සමිතිය :—

| සමිතියේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි කළ දිනය |
|---|---|---|
| සීමාසහිත පඬුවස්නුවර විවිධ සේවා සමුපකාර සමිතිය ... ... ... ... | කුලි./112 ... | 1973.10.19 |

11–726—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**ලංකාණ්ඩුවේ දුම්රිය සේවය**

දුම්රිය හරස් පාරවල් අළුත්වැඩියා කිරීම

මුහුදුබඩ දුම්රිය මාර්ගයේ අහංගම හා වැලිගම දුම්රිය ස්ථාන අතර සැතපුම් 88 දම්වැල් 17 පුරුක් 75 ස්ථානයේ කුඹල්ගම හරහා දිවෙන ගාල්ල–මාතර පැරණි මහා මාර්ගයේ සැතපුම් 87 දම්වැල් 70 ස්ථානයේ පිහිටි දුම්රිය හරස් මහ 73.11.24 හා 25 දිනවල අළුත්වැඩියා කරණු ලැබේ.

මෙම හරස් මහ 73.11.24 දින පස්වරු 1.30 සිට පස්වරු 7.00 දක්වා සහ 73.11.25 දින පෙරවරු 6.00 සිට පස්වරු 2.00 දක්වා අර්ධ වශයෙන් 73.11.24 දින පස්වරු 7.00 සිට 73.11.25 දින පෙරවරු 6.00 දක්වා සම්පූර්ණයෙන්ද සියළුම මහා මාර්ග වාහන ආදිය සඳහා වසනු ලැබේ.

සම්පූර්ණයෙන් වසන කාලය තුළදී සියළුම රථවාහනවලට ගාල්ල–මාතර මහා මාර්ගයේ නව මුහුදු මාවත පාවිච්චි කිරීමට සිදුවනු ඇත.

ජේ. පෝල් සේනාරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

11–720—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**අ/මීවැව ශ්‍රී මේඝවර්ණ පිරිවෙන, මීවැව,—ආඩියාගල**

උතුරු මැද පලාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, දකුණු කලාගම් පලාතේ අංක 50 කුලානට අයත්ව මීවැව ගමේ පිහිටි, අ/මීවැව ශ්‍රී මේඝවර්ණ පිරිවෙන, 1959 ජුලයි මස 31 වැනි දින නිකුත් කරනු ලැබූ, 1939 අංක 31 දරණ අධ්‍යාපන ව්‍යවස්ථාවේ 3(4) වැනි ඡෙදය අනුව, රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා එම පිරිවෙනේ කාර්‍යාධිකාරි ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ.

2. මේ දැන්වීම ප්‍රසිද්ධ කළ දින සිට තිස් දවසක් ඇතුළත මෙම ඉල්ලීමට විරුද්ධත්වයක් ඇත්නම් පහත සඳහන් මා වෙත එක එල්ලේම දැන්විය යුතු බව ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. එම්. ඩබ්ලිව්. ද සිල්වා,
උතුරු මැද ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

අනු 3/1/724.
1973 නොවැම්බර් මස 07 දින,
අනුරාධපුර, උතුරු මැද ප්‍රදේශයේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

11–791—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

**ගා/සුධර්මෝදය පිරිවෙන—දික්කුඹුර**

දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ දික්කුඹුරේ පිහිටි ඉහත සඳහන් පිරිවෙන රජයේ ආධාර ලබන කණිෂ්ඨ පිරිවෙනක් ලෙස ලියා පදිංචි කිරීමට වල්පල විජිත ස්ථවිරයන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ.

මෙම දැන්වීම ප්‍රසිද්ධ කළ දිනයේ සිට දින තිහක් ඇතුළත, මේ ඉල්ලීමට විරුද්ධතාවයක් ඇත්නම් මා වෙත ලියා එවන ලෙස මෙයින් දන්වමි.

බී. ජී. ඩී. ප්‍රනාන්දු,
ගාල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

ගා/3/5/1319,
1973 නොවැම්බර් මස 06 වැනි දින,
ගාල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

11–789—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

**පරිච්ඡෙද අංක 120 දරන ඉඩම් ලියා පදිංචි කිරීමේ වෙළුම්වල (නැවත සකස් කල පත්‍රිකා පිළිබඳ) ආඥා පනත**

මෙහි පහත උපලේඛනයෙහි, එහි (2) වෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ (3) වෙනි තීරුවේ සඳහන් ඔප්පුවලට අදල (1) වෙනි තීරුවේ දක්වෙන දනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියා පදිංචි කල වෙළුම් පත්‍රිකා නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් පරිච්ඡෙද අංක 120 දරන ඉඩම් ලියා පදිංචිකල වෙළුම්වල (නැවත සකස් කල පත්‍රිකා පිළිබඳ) ආඥපනතේ 4 වෙනි වගන්තිය අනුව මෙයින් දනුම් දෙමි.

2. වර්ෂ 1973 නොවැම්බර් මස 30 වෙනි දින සිට 1973 දෙසැම්බර් මස 30 වෙනි දින දක්වා සතියේ (ඉරු දින හැර) රාජකාරි කරන දිනවල පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා ද, සෙනසුරාද දිනවල පෙරවරු 9.00 සිට 11.00 දක්වා ද ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පත්‍රිකා මඩකලපුව ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

3. එම තාවකාලික පත්‍රිකාවල කිසියම් සටහනක් පිළිබඳව හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳ ව හෝ විරුද්ධතාවයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙක් විසින් හෝ යම්කිසි සටහනක් හෝ යම්කිසි සටහනකින් අත්හැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති අයෙකු විසින් හෝ එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම පහත අත්සන් කල අයට ලියවිල්ලකින් දන්වා සිටිය යුතුයි. එම ලියවිල්ල වර්ෂ 1974 ජනවාරි මස 30 වෙනි දිනට පෙර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයට ලැබෙන ලෙස එවිය යුතුයි. එය ලියා පදිංචි කල තැපැලෙන් එවන්නේ නම් යෙහෙකි. විරුද්ධතාවය හෝ ඉල්ලීම සම්බන්ධව විස්තර පැහැදිලි ලෙසත් සම්පූර්ණ ලෙසත් එකී ලියවිල්ලේ අඩංගු විය යුතුය. එවැනි විරුද්ධතාවය හෝ ඉල්ලීම තහවුරු කිරීමට ආධාරවන සියලුම ලියවිලි ද එම ලියවිලි සමග එවිය යුතුය.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයය,
කොළඹ. 1973 නොවැම්බර් මස 7 දින දී ය.

හමීඩ් fපාරුක්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

උපලේඛනය

| ඉඩම් ලියාපදිංචි කල වෙළුමේ කැඩී බිඳී ඇත් පත්‍රිකාවේ විස්තර (1) | පත්‍රිකාව අනුව ඉඩමේ විස්තර (2) | ලියා පදිංචිකිරීමේ ඔප්පුවල විස්තර (3) |
|---|---|---|
| මඩකලපුව ඉඩම් ලියා පදිංචි කරන කාර්යාලයේ "බී" අක්ෂරය දරන කොට්ඨාශයේ 138 වෙනි වෙළුමේ 172 වෙනි පිටුව | නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනෙයි පත්තුවේ නාවට්කුඩාහි පිහිටි අම්පට්ටයිවලව නැගෙනහිර දෙකෙන් පංගුවක මායිම්, උතුරට: කන්නප්පර් සින්නිතම්බිට අයිති ඉඩම, නැගෙනහිරට : මුරුකප්පර් චින්න පිල්ලෙයිට අයිති ඉඩම ද, දකුණට : පටුමග ද , බස්නාහිරට : ශු. ආර්. නාංකරෙත්නම් ට අයිති මෙම ඉඩමේ බස්නාහිර දෙකෙන් පංගුව ද යන මායිම් තුල උතුරේ සිට දකුණට බඹ 18½ සහ 20¼ ද නැගෙනහිරෙ සිට බස්නාහිරට බඹ 14¼ ක් විශාල ඉඩම වේ. | එන්. එස්. රාසයියා නොතාරිස් තැන සහතික කල අංක 6273 සහ 1935.11.15 දින දරන ඔප්පුව |
| එම ... | එම ... | සී. කන්නප්පා නොතාරිස් සහතික කල 19295 සහ 1943.8.21 දින දරන ඔප්පුව |
| මඩකලපුව ඉඩම් ලියා පදිංචි කරන කාර්යාලයේ "බී" අක්ෂරය දරන කොට්ඨාශයේ 138 වෙනි වෙළුමේ 173 වෙනි පිටුව | නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනෙයි පත්තුවේ කෝඩ්ඩමුනෛ උප්ඩෙයි පිහිටි කිරියෝඩෙයි වලවු උතුරු පැත්තේ කොටස වන ඉඩමට මායිම්. නැගෙනහිරට : අන්තෝනිගේ වැන්දඹු කැතරිනාට අයිති ඉඩම ද, බස්නාහිරට : දීමනාකුරුට අයිති ඉඩමද, උතුරට : අනාකරට අයිති ඉඩම ද, දකුණට : ආණ්ඩුව සන්තක මෙම ඉඩමේ දකුණු කොටස ද, මායිම් තුල නැගෙනහිරේ සිට බස්නාහිරට බඹ 10 ක්ද, උතුරේ සිට දකුණට බඹ 23ක් විශාල ඉඩම වේ. | එන්. එස්. රාසයියා නොතාරිස් තැන සහතික කල අංක 6278 සහ 1935.3.18 දින දරන ඔප්පුව |
| එම ... | එම ... | එන්. එස්. රාසයියා නොතාරිස් සහතික කල අංක 13185 සහ 1948.4.2 දින දරන ඔප්පුව |
| එම ... | එම ... | ඉල්ලීම කල දිනය 48.4.19 |
| එම ... | එම ... | එන්. එස්. රාසයියා නොතාරිස් සහතික කල අංක 15666 සහ 1951.11.17 දින දරන ඔප්පුව |
| එම ... | එම ... | ඉල්ලීම කල දිනය 1951.12.13 |
| එම ... | එම ... | අවලංගු කල දිනය 1952.1.3 |
| මඩකලපුව ඉඩම් ලියාපදිංචි කරන කාර්යාලයේ 'බී' අක්ෂරය දරන කොට්ඨාශයේ 138 වෙනි වෙළුමේ 174 වෙනි පිටුව | නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනෙයි පත්තුවේ ආරෙප්පට්ටෙට පිහිටි තෙන්පුරත්තු වලවු නැගෙනහිර කොටසට මායිම්, උතුරට : පරමකුඩ්ඩිට අයිති ඉඩම. දකුණට : කාසිනාදන්ට සහ තවත් අයෙකුට අයිති ඉඩම. නැගෙනහිරට : කන්දප්පට අයිති ඉඩම සහ බස්නාහිරට : මෙම ඉඩමේ බස්නාහිර කොටසද මායිම්වූ උතුරේ සිට දකුණට බඹ 9ක් සහ නැගෙනහිරේ සිට බස්නාහිරට බඹ 9ක් විශාල ඉඩම වේ. | සී. කන්දප්පා නොතාරිස් සහතික කල අංක 4585 සහ 1922.11.8 දින දරන ඔප්පුව |
| එම ... | එම ... | දිස්ත්‍රික් නඩුකාර තැන්පත් පී. වෛත්‍යලිංගම් අත්සන් කල 1935.1.6 දින දරන ලියවිල්ල |
| එම ... | එම ... | පී. ශණ්මුදලි නොතාරිස් සහතික කරන ලද අංක 21361 සහ 1959.12.15 දින දරන ඔප්පුව |
| එම ... | එම ... | අවලංගු කල දිනය 1960.10.10 |
| එම ... | එම ... | එස්. තම්බිරාජා නොතාරිස් සහතික කල අංක 665 සහ 1960.11.16 දින දරන ඔප්පුව |

11–717—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| නොවැම්බර් | 73.11.02 | සිකුරාද | ... | 73.10.26 | සිකුරාද | දහවල් | 12.00 |
| | 73.11.09 | සිකුරාද | ... | 73.11.02 | සිකුරාද | දහවල් | 12.00 |
| | 73.11.16 | සිකුරාද | ... | 73.11.09 | සිකුරාද | දහවල් | 12.00 |
| | 73.11.23 | සිකුරාද | ... | 73.11.16 | සිකුරාද | දහවල් | 12.00 |
| | 73.11.30 | සිකුරාද | ... | 73.11.23 | සිකුරාද | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 73.12.07 | සිකුරාද | ... | 73.11.30 | සිකුරාද | දහවල් | 12.00 |
| | 73.12.14 | සිකුරාද | ... | 73.12.07 | සිකුරාද | දහවල් | 12.00 |
| | 73.12.21 | සිකුරාද | ... | 73.12.14 | සිකුරාද | දහවල් | 12.00 |
| | 73.12.28 | සිකුරාද | ... | 73.12.21 | සිකුරාද | දහවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.